Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023 ජනවාරි 26, කොළඹ

## Nestlé Professional, ශ්‍රී ලංකාවේ සූපවේදී කුසලතා වැඩිදියුණු කිරීමට Nestlé Golden Chef's Hat තරගය සංවිධානය කරයි

- ස්විස් හෝටල් කළමනාකරණ පාසලෙන් (Swiss Hotel Management School) ශිෂ්‍යත්ව හතරක් පිරිනමයි

ඉදිරියේදී අපේක්ෂිත මෙරට සංචාරක කර්මාන්තයේ පිබිදීමත් සමඟ මතුවන නිපුණතා අවශ්‍යතාව සපුරාලීමේ වැදගත් පියවරක් වශයෙන් ශ්‍රී ලංකා සූපවේදී සංසදය (Chef's Guild of Lanka) සමඟ එක්ව Nestlé Golden Chef's Hat තරගය සංවිධානය කිරීමට Nestlé Professional Sri Lanka පියවර ගත්තේය. නෙස්ලේ ලංකා සමාගමේ ව්‍යාපාරික ගනුදෙනු අංශයවන Nestlé Professional Sri Lanka, ආහාර සේවා අංශ වෘත්තිකයින් හා එක්ව ව්‍යාපාරික අභියෝග සහ අවස්ථාවලට මුහුණ දෙමින් සාර්ථක වීමට අවශ්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වයි. ඒ අනුව ලොව හොඳම ආගන්තුක සත්කාර පාසල් තුනෙන් එකක්වන ස්විස් හෝටල් කළමනාකරණ ඇකඩමිය (Swiss Hotel Management Academy) සමඟ සහයෝගීතාවකට Nestlé Professional Sri Lanka එළඹ තිබේ. එම ඇකඩමියේ දේශීය ව්‍යාපාර සහකරු ලෙස A. Baur & Co. (පුද්ගලික) සමාගම කටයුතු කරයි.

ඒ අනුව Nestlé Golden Chef's Hat ජයග්‍රාහකයින් දෙදෙනෙකුට සහ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ (Sri Lanka Institute of Tourism and Hotel Management) විශිෂ්ට දක්ෂතා දක්වන සිසුන් දෙදෙනෙකු වෙත ශිෂ්‍යත්ව පිරිනමන ලදී. 2023 ජනවාරි 9 වැනිදා පැවැති විශේෂ උත්සවයකදී ශ්‍රී ලංකා සත්කාර සේවා උපාධිධාරී සංගමය වෙත මෙම ශිෂ්‍යත්ව ලබාදීමට Nestlé Professional කටයුතු කළේය. එම අවස්ථාවට, ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ස්විස් තානාපති ගරු ඩොමිනික් ෆර්ග්ලර්, ශ්‍රී ලංකා සූපවේදී සංසදයේ සභාපති ජෙරාඩ් මෙන්ඩිස්, ශ්‍රී ලංකා සත්කාර සේවා උපාධිධාරී සංගමයේ සභාපති අසේල වැවිට, A. Baur & Co. (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී රොල්ෆ් බ්ලාසර්, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සභාපති ශිරන්ත පීරිස්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති චලක ගජබාහු සහ නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා යන මහත්වරු සහභාගී වූහ.

"ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන සංචාරක කර්මාන්තයට පසුගිය වසර ගණනාව මුළුල්ලේම බොහෝ බාධකවලට මුහුණ දීමට සිදුවුණා. එවන් පසුබිමක, Nestlé Professional මගින් ලබාදෙන උසස් තත්ත්වයේ විසඳුම්වලට අමතරව මෙවැනි අවස්ථාවන් නිර්මාණය කරමින් ශ්‍රී ලංකාවේ ආහාර සේවා කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් සහායවීමට හැකිවීම ගැන අපි මහත් සේ සතුටට පත්වෙනවා. ජන ජීවිතයේ

තත්ත්වය උසස් කිරීම වෙනුවෙන් ආහාර සතු ශක්තිය මුදාහැරීම වෙනුවෙන් කැපවී සිටින ආයතනයක් වශයෙන් අපි, වසර 115ක් මුළුල්ලේ කුමන බාධක අප හමුවට පැමිණියත් අපගේ පාර්ශ්වකරුවන් සමඟ එක්ව කටයුතු කළා. එබැවින් ශ්‍රී ලංකාව වෙනුවෙන් සේවය කිරීමේ මෙම ගමනේදී, අප හා සමාන අදහස් ඇති සංවිධාන සමඟ එක්ව කටයුතු කිරීමට ලැබීම අපට විශාල ආඩම්බරයක්. එමෙන්ම Nestlé Golden Chef's Hat තරගයේ ජයග්‍රාහකයින්ට සහ ශිෂ්‍යත්වලාභීන්ට ශුභාශිංසන එක්කිරීමට ද මෙය අවස්ථාවක් කරගැනීමට කැමතියි", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනයා මහතා උත්සව සභාව අමතමින් ප්‍රකාශ කළේය.

"ශ්‍රී ලංකාවේ ආහාර සේවා කර්මාන්තය මේ වනවිට මුහුණ දෙමින් සිටින බුද්ධි ගලනය හමුවේ රට පුරා සූපවේදීන් 1,000කට වැඩි ප්‍රමාණයක් පුහුණු කිරීමේ දැවැන්ත අභියෝගයක් අප හමුවේ පවතිනවා. එවන් පසුබිමක, සංචාරක කර්මාන්තයේ අනාගතය වෙනුවෙන් තරුණ නවක සූපවේදීන්ගේ කුසලතා වැඩිදියුණු කිරීමට නෙස්ලේ ලංකා සමාගම මෙවැනි වැදගත් පියවරක් ගැනීම පිළිබඳව මම බොහෝ සතුටට පත්වෙනවා", යනුවෙන් ශ්‍රී ලංකා සූපවේදී සංසදයේ සභාපති ජෙරාඩ් මෙන්ඩිස් මහතා පැවසුවේය.

"ශ්‍රී ලංකා සත්කාර සේවා උපාධිධාරී සංගමයත් මෙම වටිනා වැඩසටහනට දායකවීමට හැකිවීම ගැන බෙහෙවින් සතුටට පත්වෙනවා. Nestlé Professional මගින් පිරිනැමුණු ශිෂ්‍යත්ව හරහා අපගේ සිසුන්ට තම කුසලතා වැඩිදියුණු කරගැනීමටත්, ඒ හරහා ශ්‍රී ලංකාව තුළ සත්කාර අංශයේ අභිවෘද්ධියත් ළඟාකරගත හැකියි", යනුවෙන් ශ්‍රී ලංකා සත්කාර සේවා උපාධිධාරී සංගමයේ සභාපති අසේල වැව්ට මහතා ප්‍රකාශ කළේය.

'වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ඉහළ ගුණාත්මකබවින් යුතු සිය ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත. 1906 වසරේ පටන් ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් සිදුකරන නෙස්ලේ ලංකා සමාගම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට බද්ධ වී ඇත. එමෙන්ම 25,000කට වැඩි ශ්‍රී ලාංකික කිරි සහ පොල් ගොවීන් මෙන්ම ගෙවතු වගාකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධනයට දායකවන නෙස්ලේ ලංකා සමාගමේ සෘජු රැකියා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව 800 ඉක්මවයි. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් කර්මාන්තශාලාවේ දැඩි සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි.

**සේයාරුව 1:**

වමේ සිට දකුණට : A. Baur & Co. (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී රොල්ෆ් බ්ලාසර්, Nestlé Professional Sri Lanka දේශීය කළමනාකරු මධුරංග පෙරේරා, ශ්‍රී ලංකා සූපවේදී සංසදයේ සභාපති ජෙරාඩ් මෙන්ඩිස්, Nestlé Professional Sri Lanka උප සභාපති රොෂාන් පෙරේරා, තරගයේ ජයග්‍රාහක ආන්ද්‍රිගේ

චරිත් මාධව (සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, කොළඹ), ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ස්විස් තානාපති ගරු ඩොමිනික් ෆර්ග්ලර් සහ නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා යන මහත්වරු

**ඡේයාරුව 2:**
වමේ සිට දකුණට : A. Baur & Co. (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී රොල්ෆ් බිලාසර්, Nestlé Professional Sri Lanka දේශීය කළමනාකරු මධුරංග පෙරේරා, ශ්‍රී ලංකා සූපවේදී සංසදයේ සභාපති ජෙරාඩ් මෙන්ඩිස්, Nestlé Professional Sri Lanka උප සභාපති රොෂාන් පෙරේරා, තරගයේ දෙවැනි ස්ථානය දිනාගත් ඩබ්.ජී. එම්.එන්. අබේරත්න (සිනමන් ලේක්සයිඩ් හෝටලය, කොළඹ), ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ස්විස් තානාපති ගරු ඩොමිනික් ෆර්ග්ලර් සහ නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා යන මහත්වරු

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |